**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2015**
---

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,723,538 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

වත්කමක් මූල්‍ය නොවන ගණුදෙනුවක් මගින් ලබාගෙන ඇති අවස්ථාවක එම වත්කමේ පිරිවැය වශයෙන් වත්කම පවරා ගන්නා දිනට පවතින සාධාරණ අගය (Fair Value) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් විවෘත විශ්වවිද්‍යාලය මගින් පවරාදී තිබුණු පර්චස් 4.8 ක භූමි ප්‍රමාණය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

**2.3** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2011 ජූලි 12 දිනැති අංක 959 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | පරිවාස කාලය නොඉක්මවූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුට වැටුප් සහිත විදේශ නිවාඩු ලබාදී වැටුප් හා දීමනා ලෙස රු.1,749,923 ක් ගෙවා තිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන චක්‍රලේඛ 04/2013 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරි වර්ෂයේ මාර්තු 17 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම පිළිබඳ තහවුරු කරගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.7,868,876 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2011 ජනවාරි 27 දිනැති PED 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | යම් රාජ්‍ය ආයතනයක අතිරික්ත අරමුදල් පවතීනම් ඉදිරි මාස 06 සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය හැර ඉතිරිය භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවද ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.61,494,422 ක් ආයෝජනය කර තිබුණි. |

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,656,049 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,400,723 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,255,326 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන රු.3,500,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් පැවතුණි. සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.4,915,394 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.20,665,112 ක් විය.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කළමනාකරණ ක්‍රියාකාරකම්

ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හා භාවිතයට ගත නොහැකි වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත්කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී තිබුණද 2015 දෙසැම්බර් 31 දින දක්වා එම කටයුතු ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2** අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අදාළත්වය හා ගුණත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (IRQUE) මගින් ජාතික විශ්වවිද්‍යාල 12 ක සහ පෞද්ගලික ආයතන 02 ක ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය ඇති කිරීම වෙනුවෙන් ඇගයීම් සිදුකිරීම සඳහා ආයතනය වෙත

රු.6,623,925 ක මුදලක් ලබා දී තිබුණි. එම මුදලින් වියදම් දරා ඉතිරි වූ රු.3,898,298 ක් කළමනාකරණ අනුමැතිය මත පමණක් සංවර්ධන අරමුදලට බැරකර තිබුණි.

(ආ) ආයතනයේ ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන මුළුමනින්ම උපයෝජනය කිරීමකින් තොරව ප්‍රාග්ධන වියදම් සඳහා නැවත ඉල්ලීම් කර මුදල් ලබාගෙන තිබූ බැවින් 2014 වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂය අවසානයේ පිළිවෙලින් රු.8,216,882 හා රු.44,676,212 ක ප්‍රාග්ධන ප්‍රදාන ඌන උපයෝජිතව පැවතුණි.

4.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.80,454,356 (බදු රහිත) ක වටිනාකමකට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සඳහා 2014 සැප්තැම්බර් 01 දින ලබාදී තිබුණු රු.16,090,871 ක සචලීකරණ අත්තිකාරම් මුදලට අමතරව ව්‍යාපෘතිය අධීක්ෂණ ඉංජිනේරුවරයාගේ සහතිකයකින් තොරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ බිල්පතක් පදනම් කර ගනිමින් අවස්ථා දෙකකදී එකතුව රු.16,650,000 ක් ගෙවීම් කර තිබුණි.

4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම

-------------------------------------------------------------------

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය වෙත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් නිත්‍යානුකූල හිමිකම් ඔප්පුවකින් පවරාදී නොතිබුණු ඉඩමක මහල් 04 කින් යුත් රු.90,500,000 ක් වටිනා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කර තිබුණද 2015 දෙසැම්බර් 31 දින දක්වාම ඉඩමේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

--------------------

2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ වන භෞතික හා මානව සම්පත්, සංවිධාන සටහන, ශක්‍යතා අධ්‍යයන සහ පසුගිය වර්ෂ 03 ක මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ විස්තර දක්වා නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

උපායමාර්ගික සැලැස්ම මගින් 2014, 2015 වර්ෂයන්වලදී ඉටුකර ගැනීමට අපේක්ෂාවෙන් සිටි සියලුම කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනයේ නිරන්තරයෙන්ම පවත්නා මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු නොකිරීම වැනි අඩුපාඩු අවම කරගැනීම සඳහා අභ්‍යන්තර විගණනය සැලසුම්කර නොතිබුණි.

**5.4** **අයවැය ලේඛනමය පාලනය**

**-----------------------------------**

**අයවැයගත ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ප්‍රමාණාත්මක විචලතාවයන් දක්නට ලැබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මුල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.**

**6.** **පද්ධති හා පාලනයන්**

**--------------------------**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.**

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන කාර්යමණ්ඩලය පැමිණීම, පිටවීම තහවුරු කරගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි. |
| (ආ) | කොන්ත්‍රාත් පාලනය | කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා නිසි අධීක්ෂණයකින් තොරව අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (ඇ) | මූල්‍ය පාලනය | ප්‍රාග්ධන ප්‍රදාන නිසිපරිදි උපයෝගී කර නොතිබුණි. |
| (ඈ) | අභ්‍යන්තර විගණනය | ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණනය උපයෝගී කර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. |